# දේශාභිමානී



# ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය හමුදාවේ කෙඩෙට් නිලධාරියෙකු ලෙස [කෙටිකාලීන පාඨමාලාව] සේවයට එක්වීමට

# ඔබටත් අවස්ථාවක්

## මූලික සුදුසුකම්

- පුරවැසිභාවය : ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියෙකු විය යුතුයි.
- වයස : 2022 ජුනි මස 30 වන දිනට වයස අවුරුදු 18 ත් 24 ත් අතර විය යුතුය.
- උස : අඩි 5 අඟල් 6 ට (167.5cm) නොඅඩු විය යුතුය.
- බර : කි.ග්‍රෑ. 52 (රාත්තල් 118) ට නොඅඩු විය යුතුය.
- පපුව : අඟල් 32 ට නොඅඩු විය යුතුය.
- දෘෂ්ඨි තීක්ෂණතාවය : 6/6 (උපැස් සහ කාච රහිතව)
- ශරීර ස්කන්ධ දර්ශකය : (18.5 $Kg/m^2$ - 25 $kg/m^2$ අතර විය යුතුය.)
- විවාහක/අවිවාහක බව : අවිවාහක විය යුතුය.

## අධ්‍යාපන සුදුසුකම්

- අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී එකවර විෂයන් තුනක් (03) සමත්වීම (සාමාන්‍ය සමාර්ථ) හා සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ක ලකුණු ප්‍රතිශතයක් ලබා තිබීම.

- 2021 වර්ෂය අ.පො.ස (උ/පෙළ) විභාගයට පෙනීසිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අයවලුන් හට ද ඉහත සුදුසුකම් සපුරාලීමේ පදනම මත අයදුම් කළ හැක.

සහ

- අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී එකවර විෂයන් පහකට (05) සම්මාන සාමාර්ථ සමග විෂයන් අටක් (08) සමත්වීම හා තෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි, ගණිතය හා සිංහල/දෙමළ විෂයන් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම. ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) පමණක් ලබා ඇති අයදුම්කරුවන් අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ NVQ Level - 4 මට්ටමේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන ආයතනයක් මගින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඩිප්ලෝමා/උපාධි පාඨමාලාවක් හදාරා තිබීම සලකා බලනු ලැබේ(NVQ සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතුය).

හෝ

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) විභාග වලට සමගාමී ජාත්‍යන්තර විභාගයකින් (Pearson/ Edexcel, GCSE, GCE, හා Cambridge හෝ වෙනත්) ඒ හා සාමාන සාමාර්ථ ලබා තිබිය යුතුයි. (ඉහත අනිවාර්ය විෂයන් ද සමත්විය යුතුය).

## වෙනත් සුදුසුකම්

- ජාත්‍යන්තර/ජාතික මට්ටමින් ක්‍රීඩා, නායකත්ව හා වෙනත් ජයග්‍රහණ ලබා තිබීම සහ වෙනත් භාෂා (සිංහල හා ඉංග්‍රීසි හැර) හැසිරවීමේ හැකියාව විශේෂ සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.

## වැටුප් හා දීමනා සහ අනෙකුත් ප්‍රතිලාභ

- කෙඩෙට් නිලධාරී සඳහා දීමනාද ඇතුළත්ව මාසික දළ වැටුප රු. 41,705.00.

- කෙඩෙට් නිලධාරීන් හට ප්‍රවාහන, නිළ ඇඳුම්, වෛද්‍ය ප්‍රතිකාර සහ නවාතැන් පහසුකම් නොමිලේ සපයනු ලැබේ.

- කෙඩෙට් නිලධාරී පාඨමාලාව සාර්ථකව අවසන් කරනු ලබන අයවලුන් දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කරනු ලැබේ.

- එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා මෙහෙයුම් සඳහා සහභාගිවීමේ අවස්ථාව සහ උසස් විදේශ පාඨමාලා හැදෑරීමේ අවස්ථාවද හිමි වේ.



නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ PDF මාධ්‍යයෙන් සකසා enlistment@army.lk විද්‍යුත් තැපැල් ලිපිනයට ඉදිරිපත් කල යුතු අතර, පහත සඳහන් වෙබ් පිටුව වෙත පිවිසීමෙන් අයදුම්පත බාගත කළ හැක.

විමසීම්:
0112 514 605

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය:
2022 මැයි 06

සියලුම විස්තර හා අයදුම්පත්:
www.army.lk/officers

පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර.